IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2013

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2015 මාර්තු)

## BLE 207 A - වාණිජ නීතිය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. 1890 හවුල් ව්‍යාපාර පනතේ පළමුවැනි වගන්තිය සහ විනිශ්චිත අධිකරණ තීරණ කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් හවුල් ව්‍යාපාරයක ස්වභාවය, විෂය පථය සහ එහි නෛසර්ගික ලක්ෂණ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

02. (අ) හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරිය හැකි ක්‍රම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) පහත සඳහන් අවස්ථාවන්හි නීතිමය තත්වය සාකච්ඡා කරන්න.

(i) නිමල් සහ වසන්ත නිතිඥ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වූහ. දිනක් වසන්ත, ටිකට් පතක් නොමැතිව කුරුණෑගල සිට යාපනය දක්වා ගමන් කළ යාල්දේවි දුම්රියෙහි ගමන් කිරීමේ වරදට අධිකරණය විසින් වරදකරු කරන ලදී. මේ නිසා ඔවුන් අතර වූ හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට නිමල් විසින් දැන්වීමක් නිකුත් කළ අතර වසන්ත ඊට විරුද්ධව නඩු පැවරිය.

(ලකුණු 05)

(ii) ආනන්ද සහ මහින්ද රෙදි පිළි විකිණීමේ හවුල් ව්‍යාපාරයක හවුල් කරුවෝ වෙති. එකී ව්‍යාපාරය ඉතා ලාභ සහිතව පවත්වාගෙන යන අතර ඔවුන් දෙදෙනා අතර තදබල අමනාපයක් හටගෙන ඇත. එය ව්‍යාපාරයේ පැවැත්මට බාධාවක් වී නැතත් ව්‍යාපාරය විසුරුවා හැරීමට අධිකරණය ඉදිරියේ නඩු පැවරීමට ආනන්ද බලාපොරොත්තු වෙයි.

(ලකුණු 05)

03. පහත සඳහන් අවස්ථා හා අදාළ නීතිමය තත්වය විනිශ්චිත අධිකරණ තීරණ ඇසුරින් විස්තර කරන්න.

(i) ජයන්තට අයත් ඇපල් තොගයක් නිව්යෝර්ක් සිට කොළඹ වරායට මුහුදින් ප්‍රවාහනය කිරීමට ජෝන් වයිට් ෂිපින් ලයින්ස් නැමති නැව් සමාගම බාර ගත්තේය. පොරොන්දු වූ දිනයට වඩා සතියක් ප්‍රමාද වී අදාළ නැව කොළඹ වරායට පැමිණි අතර එම අවස්ථාවේදී වරාය සේවකයන්ගේ වැඩ වර්ජනයක් පැවති නිසා තවත් සතියකට ඇපල් තොගය ගොඩබෑමට නොහැකි විය. පසුව ඒවා ගොඩ බෑ විට පෙනී ගියේ ඒවායින් බොහොමයක් නරක් වීමට ආසන්නව පැවති බවයි.
එබැවින් එකී ඇපල් තොගය ජෝන් වයිට් ෂිපින් ලයින්ස් සමාගම විසින් ජයන්තට නොදන්වා වරායේදීම විකුණූ අතර ඒ නිසා ජයන්තට මහත් පාඩුවක් සිදු විය. තමන්ට සිදුවූ පාඩුවට වන්දි ලබා ගැනීම සඳහා ජයන්ත විසින් ජෝන් වයිට් ෂිපින් ලයින්ස් නැව් සමාගමට විරුද්ධව නඩු පැවරිය. එකී නැව් සමාගම කියා සිටියේ තමන්, ජයන්තගේ අවශ්‍යතා නියෝජිතයා වශයෙන් ක්‍රියා කළ බවයි.

(ලකුණු 10)

(ii) හිරුනිට අයත් නිවසක් විකිණීමට ගැනුම්කරුවෙකු සොයා ගැනීමට මධුක නැමති අය තැරැව්කරුවෙකු වශයෙන් පත් කළාය. මධුක ඔහුගේ මුදලින් එහෙත් ඒ බැව් වසන් කිරීම පිණිස එකී නිවස මධුකගේ සහෝදරයා වූ අකිලගේ නමින් මිලදී ගත්තේය. නිවස විකිණීමෙන් පසු මධුකගේ වංචනික ක්‍රියාව පිළිබඳව හිරුනිට දැන ගන්නට ලැබුනේය. එබැවින් ගැනුම්කරු වූ අකිලට නිවාසය බාරදීමට හිරුනි ප්‍රතික්ෂේප කළාය. මේ නිසා නිවාසය ලබා ගැනීමට අකිල විසින් හිරුනිට විරුද්ධව නඩු පැවරිය.

(ලකුණු 10)

04. "නියෝජ්‍යත්ව සම්බන්ධතාවක් පාර්ශවයන්ගේ ක්‍රියාකාරිත්වයෙන් හෝ නීතිය ක්‍රියාත්මකවීමෙන් අවසන් විය හැක. "

මෙකී ප්‍රකාශයෙහි පිහිටා නියෝජ්‍යත්ව සම්බන්ධතාවක් අවසන් වන ක්‍රම විනිශ්චිත අධිකරණ තීරණ සමඟින් පැහැදිළි කරන්න.

(ලකුණු 20)

05. "ගිවිසුමක් යනු එහි පාර්ශවකරුවන් අතර නෛතික බැඳීමක් ඇති කරන හෝ ඇති කිරීමට අදහස් කරන ලද සම්මුතියකි."

පාර්ශවයන් අතර එකඟත්වය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙකී ප්‍රකාශයෙහි පිහිටා ගිවිසුමක් නිර්මාණය කරන අයුරු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. (අ) චෙක්පත් රේඛණය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? 1927 අංක 25 දරණ විනිමය බිල්පත් ආඥා පනතේ අදාළ නෛතික විධිවිධාන සහ විනිශ්චිත අධිකරණ තීරණ සමඟින් චෙක් පත් රේඛණ වර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) (i) මහින්ද විසින් " ගනුදෙනු කළ නොහැක" යනුවෙන් චෙක්පතක් රේඛණය කොට, එය අත්සන් කොට රුපියල් පන්දාහකට චෙක්පත ලියා සකස් කරන මෙන් ඔහුගේ සේවිකාවට අණ කළේය. ඇය චෙක්පත රුපියල් පනස්දාහකට සකස් කොට ඇයගේ පෞද්ගලික ණයක් පියවීම සඳහා ප්‍රියානිට දුන්නාය. ප්‍රියානි විසින් චෙක්පතෙහි මුදල ලබා ගැනීමෙන් පසු ඒ බව මහින්ද දැන ගත්තේය. එබැවින් සිය චෙක්පතෙහි මුදල ඉල්ලා මහින්ද විසින් ප්‍රියානිට විරුද්ධව නඩු පැවරිය.

එක් එක් පාර්ශවයෙහි අයිතිවාසිකම් සහ වගකීම් විනිශ්චිත අධිකරණ තීරණ සමඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) "සුසිලා අතුකෝරලට ගෙවනු" යනුවෙන් චෙක්පතක් ලියා සකස් කර ඇති අතර එය අදායකගේ ගිණුමට යනුවෙන් රේඛණය කර ඇත. එම චෙක්පත ඇයගේ ස්වාමිපුරුෂයා වන කරුණාරත්න අතුකෝරල විසින් කැළණිය මහජන බැංකු ශාඛාවේ ඔහුගේ ගිණුමෙහි තැන්පත් කරන ලදී. සුසිලා අතුකෝරල කැළණිය මහජන බැංකුවට විරුද්ධව නඩු පවරන්නීය. බැංකුවේ වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

07. 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ දැක්වෙන කොන්දේසි සහ සහතික විනිශ්චිත අධිකරණ තීරණ සමඟින් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න.

(අ) හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්;

(ආ) අනුමැතික නියෝජ්‍යත්වය;

(ඇ) විනිමය බිල්පතක නිසි පරිදි දරන්නා.

(ලකුණු 20)